# චතාරික සමයේ දෙවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

මීකා දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

මීකා 7 : 14-15, 18-20

**'අපේ සියලු පව් මුහුදේ පත්ලට හෙළාලුව මැනව."**

සරුසාර ප්‍රදේශවලින් වට වී කාන්තාරයක හුදකලා ව සිටින ඔබේ උරුමය වන ඔබේ බැටළු රැළට එඬේරෙකුගේ කෙවිටෙන් මෙන් මඟ පෙන්නුව මැනව. පෙර කාලයේ දී මෙන් බාෂාන්හි ද ගිලියද්හි ද පෝෂණය වන්නට ඔවුන්ට ඉඩ දුන මැනව. මිසරයෙන් පිටතට ආ දවස්වල දී මෙන් අරුම පුදුම දේ අපට පෙන්නුව මැනව.

සමිඳුනි, ඔබේ ඉතිරි කුඩා පිරිසේ අපරාධය මකා දමා ඔවුන්ගේ පව් පහ කරන ඔබට සම අන් දෙවි කෙනෙක් සිටිත් ද? එතුමාණෝ උදහස සදහටම තබා නොගන්න සේක. මන්ද, එතුමාණෝ තිරසර පෙම ප්‍රිය කරන සේක. එතුමාණෝ අපට යළි අනුකම්පා කරන සේක. අපේ පව් පාගා දමන සේක. අපේ සියලු පව් මුහුදේ පත්ලට හෙළා දමන සේක. දුරාතීතයේ සිට අප පියවරුන්ට දිවුලාක් මෙන් ජාකොබ්ට විශ්වාසකමත්, ආබ්‍රහම්ට තිරසර පෙමත් දක්වන සේක.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 103 : 1-4, 9-12

පිළිතුර: සමිඳාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපූර්ණ ය.

ගීය:

මාගේ සිත සමිඳුන් පසසන්න. හද පත්ලෙන් ම එතුමන්ගේ ශුද්ධ නම පසසන්න. මාගේ සිත සමිඳුන් පසසන්න. එතුමන්ගේ සියලු උපකාර අමතක නොකරන්න.

එතුමාණෝ මාගේ සියලු පාප කමා කරන සේක. මාගේ සියලු රෝග සුව කරන සේක. මාගේ ජීවිතය පාතාල ලෝකයෙන් මුදාලන සේක. ප්‍රේමය හා දයාව නමැති කිරුළෙන් මා සරසන සේක.

එතුමාණෝ නිතර තරවටු නොකරන සේක. සදහටම සිතෙහි කෝපය තබා නොගන්න සේක. එතුමාණෝ අපේ පාපවලට සරිලන ලෙස අපට දඬුවම් නොදෙන සේක. අපේ අයුතුකම්වලට සැසඳෙන ලෙස ප්‍රතිවිපාක නොදෙන සේක.

මන්ද, පොළොවට ඉහළින් අහස උස්ව තිබෙන්නාක් මෙන් එතුමාණන් කෙරෙහි ගරුබිය පාන අයට එතුමාණන්ගේ කරුණාව මහත් ය.
නැගෙනහිරින් බටහිර ඈත්ව තිබෙන්නාක් මෙන් එතුමාණෝ අපේ පාප අපෙන් දුරු කරන සේක.

## සාධුකාරය

"පියාණෙනි දෙවියන් වහන්සේට විරුද්ධව ද, ඔබට විරුද්ධව ද මම පව් කළෙමි. මින් මතු ඔබගේ පුත්‍රයා යයි කියනු ලබන්න නොවටිමි."

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 15 : 1–3, 11–32

***"ඔබේ සහෝදරයා මැරී සිටි නමුත් නැඟිට ජීවත්ව සිටී."***

එක් දිනක් සියලු අයකැමියෝ ද පව්කාරයෝ ද ජේසුස් වහන්සේට සවන් දෙන පිණිස උන් වහන්සේ සමීපයට ආහ. පරිසිවරු ද ව්‍යවස්ථාචාර්යවරු ද "මොහු පව්කාරයන් පිළිගෙන ඔවුන් සමඟ කන්නේය. බොන්නේ ය"යි මැසිවිලි කීවෝය.

එවිට උන් වහන්සේ ඔවුනට මේ උපමාව වදාළ සේක. "එක් මනුෂ්‍යයෙකුට පුත්‍රයෝ දෙදෙනෙක් සිටියෝය. ඔවුන්ගෙන් බාලයා, 'පියාණෙනි, ඔබගේ දේපලවලින් මට අයිති කොටස දුන මැනැවැ'යි පියාට කීය. එවිට ඔහු තමාගේ දේපල ඔවුන් අතරේ බෙදා දුන්නේය. නොබෝ දිනකට පසු බාල පුත්‍රයා සියල්ල එකතු කොටගෙන දුර රටකට ගොස් එහිදී දුරාචාරයෙහි යෙදෙමින් තමාගේ සම්පත නාස්ති කර දැමීය. සියල්ල වියදම් කළ පසු ඒ රටේ මහත් සාගතයක් ඇති වූයෙන් ඔහුට අගහිඟකම් දැනෙන්නට විය. එවිට ඔහු ගොස් ඒ රටේ පුරවැසියෙකුට අතවැසි විය. ඒ පුරවැසියා ඌරන් බලන පිණිස තමාගේ ගොවිපොළට ඔහු යැවීය. ඌරන් කන කරල්වලින් වුව ද තමාගේ කුස පුරවා ගන්නට ඔහු කැමති විය. කිසිවෙක්

ඔහුට කිසිවක් නුදුන්නෝය. එවිට ඔහු හරි සිහි කල්පනාවට පැමිණ මාගේ පියාගේ කුලී කාරයන් එපමණ දෙනෙකුට ඕනෑ පමණටත් වඩා කෑම තිබේ. එහෙත් මම මෙහි සාගින්නෙන් නසිමි. මම නැගිට මාගේ පියාණන් වෙත ගොස්, පියාණෙනි, දෙවියන් වහන්සේට විරුද්ධ ව ද ඔබට විරුද්ධ ව ද පව් කළෙමි. මින් මතු ඔබගේ පුත්‍රයා යයි කියනු ලබන්නට නොවටිමි. ඔබගේ කුලීකාරයන්ගෙන් එකෙකු මෙන් මා තබාගත මැනැවැ යි ඔහුට කියන්නෙමි' යි සිතා පිටත්ව, තම පියා වෙත ගියේය.

ඔහුගේ පියා දුර තියාම ඔහු දැක අනුකම්පාවෙන් ඇලළී ගොස් දෑතින් ඔහු ගෙළ වැළඳ සිප ගත්තේය. එවිට පුත්‍රයා ඔහුට කතා කොට 'පියාණෙනි දෙවියන් වහන්සේට විරුද්ධව ද ඔබට විරුද්ධව ද මම පව් කළෙමි. මින් මතු ඔබගේ පුත්‍රයා යයි කියනු ලබන්නට නොවටිමි'යි කීය. එහෙත් පියා සිය මෙහෙකරුවන් කැඳවා 'වහා හොඳම සළුව ගෙනැවිත් මොහුට අඳවන්න. මොහුගේ ඇඟිල්ලෙහි මුදුවක් පළඳවා පාදවල වහන් ද දමන්න. තර කළ වස්සා ගෙනැවිත් මරන්න. අපි කා බී ප්‍රීති ප්‍රමෝද වෙමු. මන්ද, මේ මාගේ පුත්‍රයා මැරී සිට යළි ජීවත්ව සිටියි. නැතිවී සිට සම්බ වී ය'යි කීය. එවිට ඔව්හු ප්‍රීති ප්‍රමෝද වන්නට පටන් ගත්හ.

ඔහුගේ වැඩිමහල් පුත්‍රයා ගොවිපොළට ගොස් සිටියේය. ඔහු පෙරළා එන්නේ ගෙදරට ළං වූ කල, නැටුම් වැයුම් හඬ අසා දාසයන්ගෙන් එක්කෙනෙකුට අඬගසා, 'මෙහි තේරුම කිමෙක් දැ'යි විචාළේය. ඔහු ද 'ඔබේ සහෝදරයා ඇවිත් සිටියි. ඔබේ පියා ඔහු සුවසේ ආපසු ලත් බැවින් තර කළ වස්සා මැරෙව්වේ ය'යි කීය. එහෙත් ඔහු කිපී ගෙට ඇතුළු වන්නට වත් නොකැමැති විය. එබැවින් ඔහුගේ පියා පිටතට අවුත්, ඇතුළට එන මෙන් ඔහුගෙන් ඉල්ලා සිටියේ. ඔහු උත්තර දෙමින් 'මෙපමණ අවුරුදු ගණනක් මුළුල්ලේ මම ඔබට සේවය කරමින් සිටියෙමි.

කවදාවත් ඔබගේ නියමයන් කඩ නොකළෙමි. එසේ වුවත් මාගේ මිතුරන් සමග ප්‍රීති වන්නට ඔබ එක එළු පැටවෙකු පමණවත් මට නුදුන්නෙහිය. එහෙත් ඔබගේ මුළු වත්කම පරස්ත්‍රීන් සමග නැති නාස්ති කළ මේ ඔබගේ පුතා ආ හැටියේ ම ඔහු නිසා තර කළ වස්සා මැරෙව්වෙහි ය'යි පියාට කීය. ඔහුද පිළිතුරු දෙමින්, 'පුතේ ඔබ නිතොරම මා සමග ය. මා සතු සියල්ල ඔබ සතු ය. අප ප්‍රීති සන්තෝෂ විය යුතුමය. මන්ද, මේ ඔබේ මල්ලී මැරී සිටි නමුත් නැවත ජීවත්ව සිටියි. නැතිවී සිටි නමුත් නැවත සම්භ වී ය'යි කීවේය.

සුවිශේෂ වාක්‍යය එසේ ය.